**ලෝක බැංකු අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ සංචිත සැකැස්ම - 2023 ජූලි 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**------------------------------------------------------------------------------------------------------------------------------**

ලෝක බැංකු අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ සංචිත සැකැස්මේ 2023 ජූලි 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය අතර 2020 සැප්තැම්බර් 08 දින එළඹි අංක අංක 6371 එල්කේ, 6228 එල්කේ, 8878 එල්කේ සහ 6346 එල්කේ දරණ මූල්‍ය ගිවිසුම්වල සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහත සඳහන් ව්‍යාපෘතිවල හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකය සක්‍රීය කිරීම සහ සෞඛ්‍යය, සමාජ ආරක්ෂණ, කෘෂිකර්ම, අධ්‍යාපන සහ ප්‍රවාහන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම් භාවිතයෙන් දුරස්ථව රාජ්‍ය සේවා සැපයීම වැනි කෙටි හා මධ්‍ය කාලීන මැදිහත්වීම් සහිතව කොවිඩ් – 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාර සහ ප්‍රතිසාධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා එක් හදිසි ක්‍රියාකාරී සැලැස්මක් උපයෝගී කර ගනිමින් කාර්යක්ෂම හා සම්බන්ධීකරණයෙන් යුත් ප්‍රතිචාර දැක්වීමක් සහතික කිරීම පිණිස ඒකාබද්ධ සම මූල්‍ය පදනම මත හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ එක් සංචිත ගිණුමක අරමුදල් රැස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,491කට සමාන එ.ජ.ඩො. මිලියන 56 ක් වන අතර එම මුදල අන්තර්ජාතික සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2020 ජූනි 17 වන දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

2023 ජූලි 31 දිනට ලෝක බැංකු අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ සංචිත සැකැස්මේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් භාවිතය පිළිබඳ ප්‍රකාශනය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. භෞතික කාර්යසාධනය**

**2.1 ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

**විගණන නිරීක්ෂණය**

(1)(i) මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් ආයතන ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. 2023 ජූලි 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ව්‍යාපෘතියේ සමස්ත භෞතික ඉලක්ක | අත්පත් කර ගත් ජයග්‍රහණ |
|---|---|---|
| (අ) | ක්ෂේත්‍ර භෝග සඳහා ගබඩා 102 ක් ඉදිකිරීම සහ සැපයුම් කිරුම් යන්ත්‍ර සහ ඉණිමං 102 ක් සැපයීම. | ව්‍යාපෘති 61 ක් පමණක් අවසන් කර තිබුණු අතර ව්‍යාපෘති 32 ක් ආරම්භ කර නොතිබුණි. ව්‍යාපෘති 7 ක් අවසන් කර තිබුණි. ව්‍යාපෘති 2ක් සම්පූර්ණ කර නොතිබුණි. ඉණිමං 66ක් පමණක් මිලදී ගෙන තිබුණු අතර කිරුම් යන්ත්‍ර මිලදී ගෙන නොතිබුණි. |

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

(i) සඳහන් කර ඇති ජයග්‍රහණ සම්බන්ධයෙන් එකඟ වෙමි.

විවිධ හේතූන් මත, ව්‍යාපෘතියේ මූලික අදියරේදී (ආරම්භ නොකර) ව්‍යාපෘතිය යටතේ වූ ගබඩා 32ක් අවලංගු කිරීමට සිදු විය.

ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන්ට මුහුණ දීමට සිදු වී ඇති අවිනිශ්චිත තත්ත්වයට අරමුදල් ලබා දෙන ආයතනයෙන් නිසි විසඳුමක් නොලැබීම හේතුවෙන්, ගබඩා 32ක් අවලංගු කිරීමටත්, කොන්ත්‍රාත් 07ක ඉදිකිරීම් අතරමග නතර කිරීමටත් සිදු විය. පහත සඳහන් හේතූන් මත කිරුම් යන්ත්‍ර මිලදී ගැනීමට නොහැකිව

මෙම ගබඩාව ඇතුළුව ඉදිකරන ලද සියලුම ගබඩා සඳහා ඉනිමඟක් සහ කිරුම් තරාදියක් ලබාදීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලද අතර, ඒ අනුව, සෑම ගබඩාවක් සඳහාම ඉනිමඟක් ලබා දෙන ලදී. කිරුම් තරාදිය ලබාදීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙවරක් සිදු කළද, රජය ආනයන සීමා පැනවීම හේතුවෙන් තරාදි දේශීයව හෝ ආනයනය කිරීමෙන් පසුව සැපයීමට සැපයුම්කරුවෙකු සොයා ගැනීමට නොහැකි විය.

**විගණකගේ නිර්දේශය**

අපේක්ෂිත පරිදි, සියලුම ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අවශ්‍ය වේ.

| | | | | |
|---|---|---|---|---|
| (අ) | පාසල් 486ක් සඳහා ජලය සැපයීම. | පාසල් 319ක් සඳහා පමණක් ජලය සපයා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | එම |
| (ආ) | ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය | තවමත් ක්‍රියාත්මක කර නොමැත. | අදහස් දක්වා නොතිබුණි. | එම |
| (ඇ) | අවශ්‍යතා සහිත පාසල් 881ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම. | පාසල් 867 ක සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම අවසන් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | එම |
| (ඈ) | දුම්රිය ස්ථාන 12 ක සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම. | දුම්රිය ස්ථාන 5ක වැසිකිලි ඒකක 5ක් ඉදිකිරීම අවසන් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | එම |
| (ඉ) | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ 21ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම. | පිරිමි සහ කාන්තා වැසිකිලි 16ක් ඉදිකර අවසන් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | එම |